# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 5 දරන
# අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ: ශත 60 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

## 1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින.]

එල්.ඩී.—ඕ. 4/86

**ඉන්දීය සම්භවය ඇති ඇතැම් අදේශිකයන්ට ශ්‍රී ලංකා පුරවැසි තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1964 ඔක්තෝබර් මස 30 වන දින සහ 1974 ජනවාරි මස 27 වන දින දරන ඉන්දු ලංකා ගිවිසුම්වල කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස හෝ ඉන්දියාවේ පුරවැසියන් ලෙස හෝ පිළිගෙන නොමැත්තා වූ ඉන්දීය සම්භවය ඇති තැනැත්තන් 9,75,000 ක් 1964 ඔක්තෝබර් මාසයෙහි ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටි බවට ඇස්තමේන්තු කරන ලද හෙයින් ද:

ඉන්දීය සම්භවය ඇති ඒ තැනැත්තන්ගෙන් 3,00,000 කට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීමටත්, තැනැත්තන් 5,25,000 කට ඉන්දියානු පුරවැසි භාවය ප්‍රදානය කොට ඉන්දියාවට පෙරළා යැවීමටත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඉන්දීය ආණ්ඩුව අතර 1964 ඔක්තෝබර් මස 30 වන දින දරන (සිරිමා-ශාස්ත්‍රි ගිවිසුම යනුවෙන් හඳුන්වනු ලබන) ඉන්දු ලංකා ගිවිසුමෙන් එකඟත්වයකට එළඹි හෙයින් ද:

ඉන්දීය සම්භවය ඇති ඉතිරි තැනැත්තන් 1,50,000 න් තැනැත්තන් 75,000 කට ශ්‍රී ලංකාවේ පුරවැසි භාවය ප්‍රදානය කිරීමටත් තැනැත්තන් 75,000 කට ඉන්දීය පුරවැසි භාවය ප්‍රදානය කොට ඉන්දියාවට පෙරළා යැවීමටත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඉන්දීය ආණ්ඩුව අතර 1974 ජනවාරි මස 27 වන දින දරන ඉන්දු ලංකා ගිවිසුමෙන් එකඟත්වයකට එළඹි හෙයින් ද:

ඉහත කී ගිවිසුම් යටතේ ඉන්දීය සම්භවය ඇති තැනැත්තන් 9,75,000 ක මුළු සංඛ්‍යාවෙන් තැනැත්තන් 3,75,000 කට ශ්‍රී ලංකා පුරවැසි භාවය ප්‍රදානය කළයුතු හෙයින් සහ තැනැත්තන් 6,00,000 කට ඉන්දියානු පුරවැසි භාවය ප්‍රදානය කොට ඉන්දියාවට පෙරළා යැවිය යුතු වූ හෙයින් ද:

ඉහත කී ගිවිසුම යටතේ ඉන්දියානු පුරවැසි භාවය ප්‍රදානය කොට ඉන්දියාවට පෙරළා යැවිය යුතු වූ තැනැත්තන් 6,00,000 න් තැනැත්තන් 5,06,000 කට පමණක් ඉන්දියානු පුරවැසි භාවය ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉන්දීය මහ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කර ඇති අතර ඉතිරි තැනැත්තන් 94,000 ට ශ්‍රී ලංකාවේ පුරවැසි භාවය ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද:

ඉන්දියානු පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කර ඇති තැනැත්තන් 5,06,000 කට ඉන්දියානු පුරවැසි භාවය ප්‍රදානය කිරීම මේ පනත පනවනු ලැබූ දින සිට මාස හයේ සිට අට දක්වා වූ කාලය ඇතුළත දී සම්පූර්ණ කරනු ලබන බවට ඉන්දීය ආණ්ඩුව විසින් පොරොන්දුවක් දෙනු ලැබ ඇති හෙයින් ද:

තවද මේ පනත පනවනු ලැබූ දින සිට මාස දහඅටක් ඇතුළත දී අදේශිකයන් පිළිබඳ ප්‍රශ්නය විසඳීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව තිරණය කොට ගෙන ඇති හෙයින් ද:

ශ්‍රී ලංකාවෙහි සිටින අදේශිකයන්ගේ ප්‍රශ්නය ප්‍රමාදයකින් තොරව විසඳීම ජාතියේ හිත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ඇතැම් අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීම.*

2. 1964 ඔක්තෝබර් මස 30 වන දින සහ 1974 ජනවාරි මස 27 වන දින දරන ඉන්දු ලංකා ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු තැනැත්තන් 3,75,000 ට අමතරව ඒ ගිවිසුම් යටතේ ඉන්දියානු පුරවැසි භාවය ප්‍රදානය කරනු ලැබිය යුතු වූද, එම පුරවැසි භාවය සඳහා ඉල්ලුම් කර නැති නමුත් ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය සඳහා ඉල්ලුම් කර ඇත්තාවූ ද, තැනැත්තන් 94,000 වද, ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසි තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ගේ එකතුව 4,69,000 ක් වන පරිදි, ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

*ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය ප්‍රදානය කරන ආකාරය.*

3. 2 වන වගන්තියෙහි සඳහන් තැනැත්තන් 4,69,000 ට ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය ප්‍රදානය කිරීම පහත දැක්වෙන ආකාරයට කරනු ලැබිය යුතු ය:—

(අ) 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ 8 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව තැනැත්තන් 2,89,140 කට ඒ පනත යටතේ එම තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් තැනැත්තන් 2,89,140 ට එම තත්ත්වය ප්‍රදානය කරනු ලැබූ පසුව ඉතිරි තැනැත්තන් 1,79,860 විසින් නියමිත ආකෘතියෙහි පුරවැසි භාවය පිළිබඳ දිවුරුම හෝ ප්‍රතිඥාව නියමිත කාලසීමාව ඇතුළත දෙනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් එම තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

*1964 ඔක්තෝබර් මස 30 වන දිනට පසු උපන් තැනැත්තන්.*

4. 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ හෝ මේ පනත යටතේ හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය යම් තැනැත්තෙකුට ප්‍රදානය කරනු ලබන අවස්ථාවක, 1964 ඔක්තෝබර් මස 30 වන දිනට පසු සහ ඒ ප්‍රදානයේ දිනයට පෙර ඒ තැනැත්තාට උපන් සෑම ළමයකුටම, අවස්ථාවෝචිත පරිදි 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ හෝ මේ පනත යටතේ හෝ සහ ඊට අනුකූලව ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

**5.** යම් තැනැත්තකු විසින් නියමිත කාලසීමාව ඇතුළත පුරවැසිභාවය සම්බන්ධ නියමිත දිවුරුම හෝ ප්‍රතිඥාව දීම මත මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය ඒ තැනැත්තාට ප්‍රදානය කරනු ලබන අවස්ථාවක අමාත්‍යවරයා විසින්—

මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කිරීම.

(අ) තත් කාර්යය සඳහා තබා ගත යුතු ලේඛනයක ඒ තැනැත්තාගේ නම සහ වෙනත් නියමිත විස්තර, සටහන් කිරීමෙන් ඒ තැනැත්තා පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට සලස්වනු ලැබිය යුතු ය ;

(ආ) නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබිය යුතු ය. තවද ඒ නිකුත් කිරීමේ දිනයෙහි දී වයස අවුරුදු දහහතරට අඩු ඒ තැනැත්තාගේ සෑම ළමයකුගේම නම ඒ සහතිකයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය ; තවද

(ඇ) ඒ තැනැත්තා මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇති බව දක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**6.** (1) මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකුම, නීතියෙහි ලා පුරවැසියන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීමට අදාළව බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් ලියාපදිංචි වූ තැනැත්තන් මෙන්, එම අයිතිවාසිකම් වලට හිමිකම ලැබිය යුතු අතර, එම බැඳීම් සහ වගකීම්වලට ද යටත් විය යුතු ය. තවද, එකී පනත් යටතේ පුරවැසියන් වශයෙන් ලියාපදිංචි වූ තැනැත්තන් සම්බන්ධයෙන් වන විට පුරවැසිභාවය අහිමිවීමේ හෝ අහිමි කිරීමේ සහ පුරවැසිභාවය අත්හැරීමේ වගකීමට අදාළ වන තාක් දුරට, මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් ලියාපදිංචි තැනැත්තන් සම්බන්ධයෙන් ඒ සමාන ආකාරයෙන් සහ ඒ සමාන ප්‍රමාණයට ඒ වෙනත් නීතියේ විධිවිධාන අදාළ විය යුතු ය.

මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තන්ගේ තත්ත්වය.

(2) මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු—

(අ) අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ මවුපියන්ගේ, මුතුන් මිත්තන්ගේ හෝ ස්වාමි පුරුෂයාගේ සම්භවය ඇති වූ දේශයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ඒ තැනැත්තාට තිබුණා වූ නැතහොත් ශ්‍රී ලංකාවෙහි එසේ ලියාපදිංචි නොවන්නට, ඒ තැනැත්තාට තිබිය හැකි වූ සිවිල් සහ දේශපාලන තත්ත්වය සම්බන්ධයෙන් වූ සියලු අයිතිවාසිකම් අත්හරිනු ලැබූ ලෙස නීතියෙහි ලා සලකනු ලැබිය යුතු ය ; තවද

(ආ) තත්ත්වයට, පුද්ගල අයිතිවාසිකම්වලට හා යුතුකම්වලට සහ ශ්‍රී ලංකාවේ දේපළවලට අදාළ හෝ ඊට සම්බන්ධ සියලු කාරණාවල දී ශ්‍රී ලංකාවේ නීතිවලට යටත් විය යුතු ය.

**අදේශිකයන්ගේ ශේෂය සම්බන්ධයෙන් විධිවිධාන.**

7. මේ පනතේ පූර්විකාවේ සඳහන් තැනැත්තන් 5,06,000 ට ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කිරීමෙන් පසු සහ 2 වන වගන්තියෙහි සඳහන් තැනැත්තන් 4,69,000 ට ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවෙහි නිත්‍යානුකූල වාසිකයන් වූ ද අදේශිකයන් වූ ද, ඉන්දියා සම්භවයෙන් යුත් යම් තැනැත්තන් ශ්‍රී ලංකාවෙහි තවදුරටත් ශේෂව සිටිය හොත්, නියම කරනු ලබන කාර්ය පටිපාටියට අනුකූලව අමාත්‍යවරයා විසින් ඒ තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

**නියෝග.**

8. (1) අමාත්‍යවරයා විසින්, මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට බලය දෙනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන වගන්තිය යටතේ සාදන ලද කිසිම නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඒ අනුමතිය සම්බන්ධයෙන් නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බලසහිත නොවිය යුතු ය.

**මේ පනත වෙනත් නීති අභිබවා බල පැවැත්විය යුතු බව.**

9. ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීමට අදාළ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ පනත නීතියෙහි ලා බලාත්මක සහ බලසහිත විය යුතු ය.